


# ලංකාවේ අධ්‍යාපන පිළිවෙත

සමස්තයක් වශයෙන් ගත් කල රටක අනාගතය වෙනුවෙන් කළ හැකි හොඳම සහ ඵලදායී ආයෝජනය වන්නේ යහපත් අධ්‍යාපනයක් ලබා ගැනීමට හැකි කෙරෙන ආකාරයේ විෂය මූලික සහ මනෝ මූලික තත්වයන් ඒ රට තුල ඇති කර ලීම යි. රටක අධ්‍යාපනය නමැති විෂය ගැන සාකච්ඡා කරන විට ඒ තුල අඩංගු විවිධ අංශ සමස්ථයක් වශයෙන් සැලකිල්ලට ගත යුතු වෙයි. ළමා සහ තරුණ පරපුරත්, වැඩි හිටි පරපුරත්, ගුරු දෙගුරු පරපුරත්, අධ්‍යාපන යටිතල සහ උඩුතල පහසුකමුත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවත්, රජයේ අධ්‍යාපන සහ අනෙක් ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙලවළුත් මෙම විෂය තුල අන්තර්ගත වන වැදගත් අංශ වේ, මෙම අංශ ගැන සලකා බලන්නට පෙර අපේ රටේ අධ්‍යාපන පසුබිම දෙස මඳක් හැරී බලමු.

1815 දී බ්‍රිතාන්‍යයන් විසින් මුළු දිවයිනම තම පාලනයට නතු කර ගැනීමෙන් පසු ආයාත නිර්යාත වෙළඳම මත පදනම් වූ ධනේශ්වර නිෂ්පාදන රටාව අපේ රටට හඳුන්වා දෙන ලදී. ප්‍රාග්ධන සංචිතකරණය ද, වැටුප් ශ්‍රමය ද, විශාල ඉඩම් කට්ටි සහ යටිතල ව්‍යුහයන් ද, බලය ටික දෙනෙකු අත කේන්ද්‍ර කර ගැනීම ද, ස්වදේශිකයන් ගෙන් පරිපාලන සහාය ලබා ගැනීම සඳහා පදනමක් ද ධනේශ්වර ක්‍රමයේ උන්නතිය සඳහා අවශ්‍ය වූයේය. 1832 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මගින් සේවා භුක්ති ක්‍රමය අහෝසි කොට, මුළු දිවයිනට ම බලපාන ලෙස ඒකීය පරිපාලනයක් ස්ථාපිත කොට, ඉගැන්වීමේ මාධ්‍යය ලෙස ඉංග්‍රීසිය යොදා ගන්නා ලද්දේ මෙම පසුබිම තුල ය.

1930 සහ 1940 ගණන් වල පැවති යටත් විජිත රජයයන් විසින් හඳුන්වා දෙන ලද අධ්‍යාපන ක්‍රමයේ මූලික ප්‍රතිපත්ති රාමුව තවමත් නොනැසී පවතින බව මගේ මතයයි. මෙම ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කරන ලද්දේ අධිරාජ්‍ය ගැති යටත් විජිත ක්‍රමය පවත්වා ගෙන යෑම පරමාර්ථ කොට ගෙන වූවද, එම රාමුව තුල පවතින යහපත් පැති ආරක්ෂා කොට ගනිමින් අයහපත් පැති යහපත් තත්වයට පත් කොට ගැනීම රටේ දැනට පවතින ධනේශ්වර ක්‍රමයේ වර්ධනය සඳහා ද අත්‍යාවශ්‍ය වන්නේය. දැනට පවතින අධ්‍යාපන ක්‍රමයේ සංවිධාන ස්වරූපයත්, ස්වභාවයත්, සංස්කෘතියත්, එම ක්‍රමයේ පලදු දරන්නන් (stake holders) විසින් දරනු ලබන සාමූහික ආකල්පත් මෙම වෙනස්කම් ඇති කිරීම තුල අන්තර්ගත කර ගත යුතුව තිබේ.

යටත් විජිත අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව යටතේ රජයේ වියදමින්ම අපේ රටේ ළමා සහ තරුණ පරපුර ප්‍රාථමික සහ ද්වීතයික අධ්‍යාපනය වෙත යොමු කරවන ලදී. එසේ කරන ලද්දේ මානව ප්‍රාග් ධනය ආර්ථික හා සමාජමය වශයෙන් වැදගත් ප්‍රතිලාභ ගෙන ආ හැකි ආකාරයේ බලාපොරොත්තු සහගත ආයෝජනයක් ලෙස සැලකිල්ලට ගැනීම නිසාය. ඒක පුද්ගල ආදායම අතින් රට පහළ තත්වයක පැවතිය ද මෙම අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ සාක්ෂරතාවය ඉහළ මට්ටමකට ළඟා වූයේය. එපමණක් නොව ප්‍රාථමික සෞඛ්‍ය තත්වය අතින් ද වෙනත් සමාජ සංවර්ධන දර්ශක අතින් ද ලාංකීය සමාජය ඉදිරියට ගොස් තිබිණි. උදාහරණ ලෙස ළදරු මරණ සංඛ්‍යාව පහත වැටුණු අතර අපේක්ෂිත ආයු ප්‍රමාණය ඉහළ ගියේය. මෙම තත්වයට අහිතකර ලෙස බලපාන ලද්දේ සාධාරණ නොවූ ආර්ථික ප්‍රතිපත්තිත්, දරිද්‍රතාවයත්, විරැකියාවත්, යුද්ධයත් ය.

යටත් විජිත පාලකයන් විසින් ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලද සියළු ජාතීන්ට අයත් වූ ස්වදේශිකයන්ට විශේෂ වරප්‍රසාද ලබා දුන් අතර සෙසු අය සලකන ලද්දේ දස ශ්‍රමිකයන් වශයෙනි. අධ්‍යාපන ක්‍රමයේ පැවතුන විෂමතාවය සහ බෙදා වෙන් කොට පාලනය කිරීමේ උපක්‍රම වැනි තත්වයන් තුලින් දේශීය ජාතික වාදයන්ගේ වර්ධනයට සපයන ලද්දේ සරුසාර බිම් ප්‍රදේශයකි. උචිත ආකාරයේ දේශපාලන සහ ආර්ථික සංවර්ධනයක් හෝ ආර්ථික ප්‍රතිලාභ සාධාරණ ආකාරයකට බෙදීයාමක් හෝ සාධාරණ අවස්ථාවන් නොමැතිවීම ලංකාවේ තරුණ කොටස් වල පෙරැලිකරණය ට (radicalization) මඟ පෑදීය. සර්ව ජන ඡන්ද බලය සහ ඡන්දය පාවිච්චි කිරීමේ වයස පහත දැමීම විසින් තරුණ ජනයා සක්‍රීය දේශපාලණයට අවතීර්ණ කරන ලදී. 1945 දී නිදහස් අධ්‍යාපනය හඳුන්වා දෙන ලද අතර පසු කාලයේ දී උගන්වන මාධ්‍යය ඉංග්‍රීසියේ සිට දේශීය භාෂාවන් වූ සිංහල සහ දෙමළ වෙත හරවන ලදී. මේ නිසා තරුණ ජන කොටස් වෙත උසස් අධ්‍යාපනයට තිබුනු අවස්ථාවන් බොහෝ සෙයින් පුළුල් විය. අපේ රටේ ග්‍රාමීය වූ සිංහල සහ දෙමළ තරුණ ජන කොටස් වෙත සහ ඔවුන්ගේ දැවෙන රැකියා වියුක්තියට කාලානුරූප සහනයක් ගෙන ආ බව ඒ කාලයේ පැවතුන පිළිගැනීම වූයේය. මේ වන විට අපේ රටේ සිසු සිසුවියන්ට නොමිලේ පොත් පත් ද, තවත් අධ්‍යාපන පහසුකම් ද ලබා දී තිබේ. මෙම තත්වයෙන් අප ලබා ඇති උරුමය කුමක්ද?

සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් පමණක් අධ්‍යාපනය ලද (ඉංග්‍රීසි අධ්‍යාපනය වරප්‍රසාද ලත් පැලැන්තියට පමණක් සීමා කොට තිබුණි.) තරුණ තරුණියන්ට සමාජ, ආර්ථික සහ දේශපාලන ජීවිතයේ සක්‍රීය ලෙස සහභාගි වෙන්නට තිබුනු අවස්ථාවන් අතිශයින් සීමාසහිත වූයේය. මේ නිසා ඉතා දුෂ්කර අවස්ථාවන් ට මුහුණ දෙන්නට තරුණ ජනයාට සිදු වූ අතර මෙයින් ඔවුන් තුල ඇති වූයේ අතෘප්තිමත් භාවය කි. ඔවුහු පවතින සමාජ ආර්ථික සහ මතවාදීමය ස්ථාවරයන් සහ තරාතිරම් (status) ද, සමාජයේ පැවති වටිනාකම් පද්ධතීන් (value systems) ද ප්‍රශ්ණ කරන්නට පටන් ගත්හ.

අපේ අධ්‍යාපන ක්‍රමයේ පලදු දරන්නන් අතර පළමු ස්ථානය හිමි විය යුත්තේ අධ්‍යාපනය ලබන ජන කොටස් වෙත ය; විශේෂයෙන් ම අධ්‍යාපනය ලබන දරු පරපුර වෙත ය. මෙම දරුවන්ට අධ්‍යාපනය ලබා දීම/ගැනීම සඳහා අපේ රටේ තිබෙන පාසැල් 75 කින් එක පාසැලක ළමයින් 3,000 කට වඩා අධික සංඛ්‍යාවක් බැගින් ඉගෙන ගන්නා අතර, තවත් පාසැල් 3,000 කින් එක පාසැලක ඉගෙන ගන්නේ ළමයින් 100 කටත් වඩා අඩු සංඛ්‍යාවකි. මෙම පාසැල් අතර භෞතික සහ ගුරු සම්පත් බෙදා හදා ගන්නට සලස්වා තිබෙන ආකාරයේ ඇති දැඩි විෂමතාවය ගැන අපි පසුව සාකච්ඡා කරමු.

අපේ ජන සාක්ෂරතාවය සියයට 95 කි. මෙය ඉතාමත් ඉහළ දර්ශකයකි. මිලියන 21 ක් පමණ වූ මුළු ජනගහනයෙන් මිලියන 6 ක් පමණ වයස අවුරුදු 18 ට අඩු තරුණ කොටස් ය. මෙයින් මිලියන 4 ක් පමණ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) දක්වා වූ නොයෙක් පාසැල් වල ඉගෙනීම ලබති. 2006 දෙසැම්බර් සංඛ්‍යා ලේඛන වලට අනුව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමට එන විට මෙම සිසුන් සංඛ්‍යාව ලක්ෂ පහකට පමණ සීමා වී ඇත. මෙම සිසුන් සංඛ්‍යාවෙන් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට සමත් වූයේ සියයට 40 ක් පමණ ප්‍රමාණයකි. ඔවුන්ගෙන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්තිවලට ඇතුල් වීමට තරම් සුදුසුකම් ලැබූයේ මීටත් අඩු ප්‍රමාණයකි. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පෙනී සිටින අය ගෙන් 25,000 ක් පමණ සියළු විෂයයන්ගෙන් අසමත් වූහ. ඉංග්‍රීසි, ගණිත සහ විද්‍යා විෂයයන්ට පෙනී සිටි අයගෙන් සාමාර්ථ වූයේ සියයට 50 ක් හෝ ඊටත් අඩු ප්‍රමාණයකි. මෙම තරුණ තරුණියන්ගෙන් රටේ තිබෙන ජාතික විශ්ව විද්‍යාල 12 ටත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පාලනය කෙරෙන ආයතන දෙකටත් ඇතුල් වූයේ 17,000 ක් පමණකි.

මෙම විශ්ව විද්‍යාල ඇතුළු වෘත්තීමය සහ තාක්ෂණික උසස් අධ්‍යාපන ආයතන වලින් පිට වෙන තරුණ තරුණියන් බොහෝ දෙනෙකුට ම රැකියා ලබා ගැනීම සඳහා මහත් දිගු කාලීන පරිශ්‍රමයක් දරන්නට සිදු වෙයි. එහෙත් අපේ රටේම තරුණ පරපුරෙන් කොටසක් ලංකාව තුලම හෝ විදේශ ගත ව ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලබා තාක්ෂණික, විද්‍යා, ගණකාධිකරණ, වාණිජ, නීති වැනි විෂයයන් හදාරා බොහෝ විට විදේශ ගතව රැකියාවල නිරත වෙති. වයස අවුරුදු 5 සහ 14 අතර වූ ළමයින්ගෙන් සියයට 3 ක් පමණ විධිවත් අධ්‍යාපනයක් ලබා ගැනීමේ නොයෙදෙති. වයස අවුරුදු 10 සහ 14 අතර වූ ළමයින්ගෙන් සියයට 2 ක් පමණ ශ්‍රමිකයන් ලෙස කල් ගෙවති. ළමයින් 20,000 ක් පමණ අපචාරයේ යොදා ගන්නා බවට වාර්තා වෙයි. අවුරුදු 15ත් 24ත් අතර වයසේ වන තරුණ තරුණියන් බොහෝ දෙනෙකු රැකියා ලබා ගැනීමට නොහැකිව කල් ගෙවති. මට ලැබෙන තොරතුරුවලට අනුව 2006 පැවති තත්වයට වඩා දැන් තත්වය තවත් නරක අතට හැරී තිබේ.

මේ සියළු කරුණු සැලකිල්ලට ගත් විට පැහැදිලි වෙන කාරණය නම් ලංකාවේ පවත්වා ගෙන ගිය සහ දැනට පවත්වා ගෙන යන අධ්‍යාපන ක්‍රමය විසින් රටේ අද පවතින අර්බුදකාරී තත්වය නිර්මාණය කිරීමට මහත් ලෙස දායක වී ඇති බව යි.

මේ පවතින අධ්‍යාපන ක්‍රමය විසින් ඇති කර තිබෙන ප්‍රතිවිපාක වල එක් පැත්තක් පමණකි. මෙම අධ්‍යාපන ක්‍රමය ලබා ගැනීම සඳහා එදිනෙදා ජීවිතයේ දී ලංකාවේ දූ දරුවන්ට ගත කරන්නට සිදු වී තිබෙන කටුක දුක් ගැහැට ගැන මීළඟට සලකා බලමු.

තොරතුරු මූලාශ්‍රය: 2006 පාසැල් සංගණනය - අධ්‍යාපන අමාත්‍යාංශය

| Schools | 9,714 |
|---|---|
| 1 AB schools | 659 |
| 1 C schools | 1,854 |
| Type 2 schools | 4,225 |
| Type 3 schools | 2,976 |
| Sinhala only | 6,435 |
| Tamil only | 2,804 |
| Sinhala and Tamil | 38 |
| Sinhala and English | 298 |
| Tamil and English | 110 |
| Sinhala, Tamil and English | 29 |
| 1-50 students | 1,549 |
| 51 -100 students | 1,392 |
| 101 - 150 students | 1,106 |
| 151 - 200 students | 860 |
| 201 - 500 students | 2,514 |
| 501 - 1000 students | 1,340 |
| 1001 - 1500 students | 485 |
| 1501 - 2000 students | 210 |
| 2001 - 3000 students | 185 |
| 3001 - 4000 students | 55 |
| 4001 students and above | 18 |
| 1 teacher schools | 124 |
| 2 teacher schools | 316 |
| 3-9 teachers | 2,769 |
| 10-25 teachers | 4,147 |
| 26-50 teachers | 1,542 |
| 51-100 teachers | 644 |
| 101 teachers and above | 172 |
| National Schools | 324 |
| Navodya Schools | 457 |



***1815 දී බ්‍රිතාන්‍යයන් විසින් මුළු දිවයිනම තම පාලනයට නතු කර ගැනීමෙන් පසු ආයාත නිර්යාත වෙළඳම මත පදනම් වූ ධනේශ්වර නිෂ්පාදන රටාව අපේ රටට හඳුන්වා දෙන ලදී. ප්‍රාග්ධන සංචිතකරණය ද, වැටුප් ශ්‍රමය ද, විශාල ඉඩම් කට්ටි සහ යටිතල ව්‍යුහයන් ද, බලය ටික දෙනෙකු අත කේන්ද්‍ර කර ගැනීම ද, ස්වදේශිකයන් ගෙන් පරිපාලන සහාය ලබා ගැනීම සඳහා පදනමක් ද ධනේශ්වර ක්‍රමයේ උන්නතිය සඳහා අවශ්‍ය වූයේය. 1832 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මගින් සේවා භුක්ති ක්‍රමය අහෝසි කොට, මුළු දිවයිනට ම බලපාන ලෙස ඒකීය පරිපාලනයක් ස්ථාපිත කොට, ඉගැන්වීමේ මාධ්‍යය ලෙස ඉංග්‍රීසිය යොදා ගන්නා ලද්දේ මෙම පසුබිම තුල ය.***

ලයනල් බෝපගේ

Photo by Ashan de Silva of SLCEP